ඒකාබද්ධ සේවා චක්‍රලේඛ ලිපි : 01/2026

මගේ අංකය : PA/CS/POLICY/පොදු
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

2026.03.12

අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්

**<u>කළමනාකරණ සේවා නිලධාරී සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් කාර්යක්ෂමතා කඩඉමෙන් නිදහස් කිරීමට අදාල පාඨමාලාව සම්බන්ධවයි</u>**

අංක 1840/34 දරණ 2013.12.11 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කළමනාකරණ සේවා නිලධාරී සේවයේ සේවා ව්‍යවස්ථාව අනුව කළමනාකරණ සේවා නිලධාරී සේවයේ නිලධාරීන් I ශ්‍රේණියට පත්වූ දින සිට වසර 05ක් ඇතුළත එම ශ්‍රේණියට අදාල කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතුව ඇත.

02. ඒ අනුව මේ වන විටත් I ශ්‍රේණියේ වසර 05ක සේවා කාලයක් සපුරා ඇතත් I ශ්‍රේණියට අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කිරීමට නොහැකිවීම හේතුවෙන් වැටුප් වර්ධක අහිමි වී ඇති නිලධාරීන් සඳහා ඒකාබද්ධ සේවා චක්‍රලේඛ ලිපි 01/2024 මගින් 2023.12.31 දින දක්වා ලබා දී තිබූ සහන කාලය, 2025.12.31 දින දක්වා දීර්ඝ කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කර ඇති බව රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/APP/4/62/2018 හා 2026.03.03 දිනැති ලිපියෙන් දන්වා ඇති බව මෙයින් දන්වා සිටිමි.

03. තවද 2025.12.31 දිනට I ශ්‍රේණියේ වසර 05ක සේවා කාලය සම්පූර්ණ කර ඇති නිලධරයන් හට ප්‍රමුඛතාවය ලබා දෙමින් ඉහත පුහුණු වැඩසටහන පැවැත්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස ද කාරුණිකව දන්වා සිටිමි.

එන්.යූ. නිෂාන් මෙන්ඩිස්
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්